ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
இலங்கை தொலைத்தொடர்புகள் ஒழுங்குபடுத்தும் ஆணைக்குழு
Telecommunications Regulatory Commission of Sri Lanka

276, ඇල්විටිගල මාවත, කොළඹ 08. 276, எல்விட்டிகல மாவத்தை, கொழும்பு 08. 276, Elvitigala Mawatha, Colombo 08.

දුරකථන / தொலைபேசி / Telephone: +94 11 2689345
ෆැක්ස් / பாக்ஸ் / Fax: +94 11 2689341
ඊ මේල් / ஈ-மெயில் / E-mail: dgtsl@trc.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No.:
මගේ අංකය / எனது இல. / My No.: TRC/SM/BT/GEN/18-008
දිනය / திகதி / Date: 06.06.2018

## ටෙල්ෂාන් පොල්ගහවෙල නීති විරෝධී රූපවාහිනී විකාශනය සම්බන්ධව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය නිවේදනය

ටෙල්පාන් නේට්වර්ක් පුද්ගලික සමාගම යන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන රූපවාහිනී විකාශනය ස්ථාන 9 කින් දිවයිනේ විවිධ ස්ථාන ආවරණය කරනු ලැබේ. ඒවා නම් කොළඹ, නුවරඑළිය, කරගහතැන්න, පිළියන්දල, අවිස්සාවේල්ල, බදුල්ල, ගොන්ගල, හන්තාන හා රත්නපුර යි. මෙම සෑම ස්ථානයකින්ම ක්‍රියාත්මක කරන විකාශන සඳහා වෙන් වෙන් වශයෙන් විකාශන (සම්ප්‍රේෂණ) යන්ත්‍ර භාවිතා කළ යුතු අතර එම සෑම විකාශන යන්ත්‍රවලට භාවිතා කිරීම සඳහා නියමිත සංඛ්‍යාත සහ ස්ථානවලට වලංගු වන පරිදි විදුලි සංදේශ පනතේ අංක 22 වගන්ති ප්‍රකාර බලපත්‍රයක් ලබා ගත යුතු වේ. මෙම බලපත්‍රයේ වලංගු කාලය අවුරුද්දක් වන අතර වලංගු කාලය අවසන් වන්නේ නම් නියමිත ඉල්ලුම්පත ඉදිරිපත් කොට නියමිත ගාස්තු ගෙවා තවත් වසරකට වලංගු කාලය දීර්ඝ කර ගත හැක.

ටෙල්පාන් ආයතනය ඉහත ස්ථාන සඳහා නියමිත ගාස්තු ගෙවා බලපත්‍ර ලබාගෙන තිබුන ද පොල්ගහවෙල VHF 11 සහ VHF 03 භාවිතා කර ගැනීම සඳහා කිසිදු අවසරයක් විදුලි සංදේශ නියාමන කොමිපන් සභාවෙන් ලබා දී නොමැත.

එම ආයතනය විසින් පොල්ගහවෙල විකාශන මධ්‍යස්ථානය මගින් විදුලි සංදේශ පනතේ අංක 22 වගන්තිය උල්ලංඝනය වන පරිදි අනෙකුත් බලපත්‍ර ලබා දී ඇති රජයේ විකාශනයන්ට බාධා වන පරිදි වරින් වර දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා කොට ඇත. මෙම නීති විරෝධී විකාශනය නවත්වන ලෙසට 2016.04.27 දින ලිපියෙන් එම ආයතනයට දැනුම් දී ඇති අතර එම නියෝගය එම ආයතනය විසින් නොසලකා හරිමින් මෙම විකාශනය ක්‍රියාත්මක කර ඇත.

රජයට ගෙවිය යුතු මුදල් නොගෙවා නිසි බලපත්‍රයක් නොමැතිව සංඛ්‍යාත භාවිතා කිරීම කිසිදු ආයතනයකට හෝ පුද්ගලයෙකුට නෛතිකමය බලයක් නොමැති වන අතර එය කිසිදු ආකාරයක සදාචාර සම්පන්න ක්‍රියාවක් නොවේ.

තවද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් බලංගොඩ ප්‍රදේශයේ සහ අනෙකුත් පුද්ගලික ආයතන මගින් දිවයිනේ විවිධ ප්‍රදේශවල මෙවැනි නීති විරෝධී ගුවන් විදුලි විකාශනාගාර පවත්වාගෙන යන බව තහවුරු වීමෙන් පසු එකී ආයතන සඳහා ද විදුලි සංදේශ පනත ප්‍රකාරව කටයුතු කර ඇත.

මෙය හුදෙක් 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතින් සංශෝධිත 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනත උල්ලංඝනය කරමින් නීතිය නොසලකා හැර කටයුතු කිරීම හේතු කොට ගෙන සිදු වූවක් වන අතර මෙම ක්‍රියාදාමය තුළ කිසිදු වෙනත් අරමුණක් නොමැති බවත් සඳහන් කිරීමට කැමැත්තෙමු.

පී.ආර්.එස්.පී. ජයතිලක
**අධ්‍යක්ෂ ජනරාල්**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
இலங்கை தொலைத்தொடர்புகள் ஒழுங்குபடுத்தும் ஆணைக்குழு
Telecommunications Regulatory Commission of Sri Lanka

276, ඇල්විටිගල මාවත, කොළඹ 08. 276, எல்விட்டிகல மாவத்தை, கொழும்பு 08. 276, Elvitigala Mawatha, Colombo 08.

දුරකථන / தொலைபேசி / Telephone: +94 11 2689345
ෆැක්ස් / பாக்ஸ் / Fax: +94 11 2689341
ඊ මේල් / ஈ-மெயில் / E-mail: dgtsl@trc.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No.:
මගේ අංකය / எனது இல. / My No.: TRC/SM/BT/2001/GEN-18-007
දිනය / திகதி / Date: 6/6/2018

**PRESS NOTICE ISSUED BY TRCSL WITH REGARD TO Telshan Network (Pvt) Limited ILLEGAL TV TRANSMISSION AT POLGAHAWELA**

TV transmission operated by Telshan Network(Pvt) Ltd is presently licensed for 9 locations throughout the country namely Colombo, Nuwara Eliya(Mt. Oliphant),Karagahatenna,Piliyandala,Awissawella,Badulla,Gongala,Hantana and Ratnapaura.

A television transmitter should be used at each of above location and a valid licence should be obtained under Section 22 of Sri Lanka Telecommunications Act No 25 of 1991 as amended by Act No 27 of 1996. The licence issued will be valid for a period of one year and renewable for another year , on payment of relevant licence fee.

Telshan Network(Pvt) Ltd has obtained a valid licence for the year 2018 ,after payment of relevant licence fee for the above 9 locations. But no licence has been issued in favour of above Company by TRCSL to use VHF CH 11 or VHF CH 3 at Polgahawela.

Telshan Network(Pvt) Ltd has operated VHF CH 11 and CH 3 from time to time for a considerable period of time in contravention to the Section 22 of Sri Lanka Telecommunication Act No 25 of 1991 as amended causing interference to other licence government broadcasters. TRCSL has informed Telshan Network(Pvt) Ltd to shut down this illegal transmission on 27.4.2016. Ignoring the above letter, Telshan Network(Pvt) Ltd has continued the aforementioned transmission causing interference to other government channels and without making due payment causing loss to the government.

Therefore TRCSL has been compelled to take action against this violation based on above grounds and TRCSL emphasizes that there is no any other undue ambition behind this action.

TRCSL has taken action against such violations with regard to illegal broadcasting stations operated by different companies including Sri Lanka Broadcasting Cooporation at Balangoda.

**Director General**
**Telecommunications Regulatory Commission**
6/6/2018